අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
THE OFFICE ON MISSING PERSONS

# භාෂා පරිවර්තක සේවාව ලබා ගැනීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම,පරිපාලනය කිරීම හා කර්තව්‍ය ඉටුකිරීම) පනත මගින් ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභාවකි. පනතෙහි සඳහන් පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්යයන්ට පුළුල්ව ඇතුලත් වන්නේ රටෙහි විවිධ වකවානුවලදී හටගත් සන්නද්ධ ගැටුම් හා දේශපාලනික නොසන්සුන්තාවයන් හේතුවෙන් හෝ අතුරුදහන්ව සිටින තැනැත්තන් සම්බන්ධයෙන්, ඔවුන් සිටිනා තැනක් පිළිබඳව සොයාබැලීම හා ඔවුන්ගේ ඥාතීන්ට සහන සැලසීමත් වේ. එසේම යළිත් එවන් සිද්ධීන් සිදු නොවනු සඳහා වන නිර්දේශයන් රජය වෙත ඉදිරිපත් කිරීම ද එම කාර්යාලයට පැවරෙන වගකීමකි.

මෙම කාර්යාලයට දමිළ භාෂාවෙන් ලැබී ඇති ලිපි/ ලේඛන සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින්ගේ සේවය ලබා ගැනීමට අදහස් කර ඇත. අදාල පරිවර්තන කටයුතු පහත ලිපිනයෙහි සඳහන් කාර්යාලයට පැමිණ සිදු කළ යුතු වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003 (IV ) අනුව ගෙවීම් කරනු ලැබේ.

අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 408, 03 වන මහල, ගාලු පාර, කොළඹ 03** යන ලිපිනයට, **2021.07.31** වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය,
අංක **408,**
**03** වන මහල,
ගාලු පාර,
කොළඹ 03